*සැ. යු.* - 2024.08.09 දින පළ කරන ලද අංක 2397 *ගැසට්* පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,398 - 2024 අගෝස්තු මස 16 වැනි සිකුරාදා - 2024.08.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් | — |
| බඩු බාහිරාදිය විකිණීම් | 2226 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් | 2238 |
| රජයේ නොවන දැන්වීම් | 2241 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් | 2245 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් | 2246 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට්* පත්‍රය පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට්* පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම *ගැසට්* පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 සැප්තැම්බර් මස 06 වැනි දින පළ කෙරෙන *ගැසට්* පත්‍රයේ දැන්වීම් 2024 අගෝස්තු මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට්* පත්‍රය *www. documents.gov. lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# බඩු බාහිරාදිය විකිණීම්

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මුතූර්**

01. මුතූර් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද හිමිකම් නොකියන ලද පහත සඳහන් නඩු භාණ්ඩ **2024.08.31** වැනි **දින පෙ.ව. 9.00** ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසිය ආරම්භකිරීමට පැය 1/2 කට කලින් වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂාකර බැලිය හැකි වේ.

03. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුවේ.

04. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ ඒ අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කරගත යුතු අතර සියලුම ගෙවීම් මුදලින් පමණක් කළ යුතුය.

05. වෙන්දේසියෙන් භාණ්ඩ මිල දී ගැනීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර අනන්‍යතාවය තහවුරු කළ යුතුය.

තස්නීම් මොහොමඩ් ෆවුසාන්,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - මුතූර්.

උපලේඛනය

| *S.N* | *Case No.* | *Description of Production* | *Qty.* |
|---|---|---|---|
| 01 | MC/57228/24 | ලොකු යකඩ බාල්දි (හිල් සහිත) | 01 |
| 02 | MC/57229/24 | ලොකු යකඩ බාල්දි (හිල් සහිත) | 01 |
| 03 | MC/57361/24 | ලොකු යකඩ බාල්දි (හිල් සහිත) | 01 |
| 04 | MC/57362/24 | ලොකු යකඩ බාල්දි (හිල් සහිත) | 01 |
| 05 | MC/57365/24 | ලොකු යකඩ බාල්දි (හිල් සහිත) | 01 |
| 06 | MC/57370/24 | ලොකු යකඩ බාල්දි (හිල් සහිත) | 01 |
| 07 | MC/57371/24 | ලොකු යකඩ බාල්දි (හිල් සහිත) | 01 |
| 08 | MC/57372/24 | ලොකු යකඩ බාල්දි (හිල් සහිත) | 01 |
| 09 | MC/57373/24 | ලොකු යකඩ බාල්දි (හිල් සහිත) | 01 |
| 10 | MC/57374/24 | ලොකු යකඩ බාල්දි (හිල් සහිත) | 01 |
| 11 | MC/57370/24 | සවල් | 01 |

| *S.N* | *Case No.* | *Description of Production* | *Qty.* |
|---|---|---|---|
| 12 | MC/57371/24 | සවල් | 01 |
| 13 | MC/57279/24 | සවල් | 01 |
| 14 | MC/57280/24 | සවල් | 01 |
| 15 | MC/57281/24 | සවල් | 01 |
| 16 | MC/57316/24 | ලොකු යකඩ මුට්ටි | 01 |
| 17 | MC/57472/24 | ලොකු ඇලුමිනියම් මුට්ටි | 01 |
| 18 | MC/57316/24 | ලොකු ඇලුමිනියම් හට්ටි | 01 |
| 19 | MC/57316/24 | ලොකු ඇලුමිනියම් හට්ටි | 01 |
| 20 | MC/57104/for/24 | පොරොව | 01 |
| 21 | MC/57105/for/24 | පොරොව | 01 |
| 22 | MC/56997/for/24 | දිරාපත් වූ දර | $1m^3$ x $1m^3$ |
| 23 | MC/57008/for/24 | දිරාපත් වූ දර | $1m^3$ |
| 24 | MC/57104/for/24 | දිරාපත් වූ දර | $1m^3$ |
| 25 | MC/57105/for/24 | දිරාපත් වූ දර | $1m^3$ |
| 26 | MC/57162/for/24 | දිරාපත් වූ දර | 0.5 $m^3$ |
| 27 | MC/57161/for/24 | දිරාපත් වූ දර | 1.5 $m^3$ |
| 28 | MC/57163/for/24 | දිරාපත් වූ දර | 0.5 $m^3$ |
| 29 | MC/57164/for/24 | දිරාපත් වූ දර | 0.5 $m^3$ |
| 30 | Unidentified Case No. | පළුදු වූ පාපැදි | 07 |
| 31 | Unidentified Case No. | වැලි | 21 Cube |
| 32 | Unidentified Case No. | පස් | 09 Cube |

**සිවිල් අභියාචනා මහාධිකරණය - කළුතර**

පරිහරණයෙන් ඉවත් කරන ලද කාර්යාලීය උපකරණ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. කළුතර සිවිල් අභියාචනා මහාධිකරණයේ භාණ්ඩ සමීක්ෂණය මගින් ඉවත් කරන ලද කාර්යාලීය උපකරණ **2024.09.02** වැනි දින ප.ව. **2.00** ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට (පැය භාගයකට) පෙර, වෙන්දේසියට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂාකර බැලිය හැකි වේ.

03. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර, සියලුම ගෙවීම් මුදලින් පමණක් සිදු කළ යුතුය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් භාණ්ඩ මිල දී ගැනීමට පැමිණෙන්නන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

06. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම් වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

ක්‍රිෂන්ති අමරතුංග,
මහාධිකරණ විනිසුරු,
සිවිල් අභියාචනා මහාධිකරණය - කළුතර.

2024 ජූලි මස 30 වැනි දින,
කළුතර සිවිල් අභියාචනා මහාධිකරණයේ දී ය.

**උපලේඛනය**

| *අනු අංකය* | *වෙන්දේසි අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|
| 01 | 1 | කැබිනට් වානේ (ලිපිගොනු) - 02 |
| 02 | 2 | ලිපිකරු මේස (ලී) - 02 |
| 03 | 3 | වායු සමීකරණ යන්ත්‍ර - 01 |
| 04 | 4 | පරිගණක (මොනිටර්) - 04 |
| 05 | 5 | පරිගණක UPS - 02 |
| 06 | 6 | පරිගණක සී.පී.යූ. - 03 |
| 07 | 7 | Toshiba 864413 - 01 |
| 08 | 8 | Toshiba 46977C2GC - 01 |

08 - 100

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - පුත්තලම**

**අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා නඩු අංක සොයාගත නොහැකි සහ මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

පුත්තලම මහෙස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද නඩුවල හා පුත්තලම අධිකරණය මගින් මෙහෙයවනු ලබන කල්පිටිය සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද නඩුවලට අදාළව හා පුත්තලම මහෙස්ත්‍රාත් අධිකරණය මගින් 2016.01.01 දිනට පෙර මෙහෙයවනු ලැබූ ආණමඩුව සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද නඩුවලට අදාළ රාජසන්තක කරන ලද හා නඩු අංක සොයා ගත නොහැකි සහ මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් නඩු භාණ්ඩ **2024 අගෝස්තු මස 31 වැනි සෙනසුරාදා දින පෙ.ව. 9.30ට** මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි උපලේඛනයේ සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳ හිමිකම් දක්වන්නෙක් වේනම්, වෙන්දේසිය පවත්වන දිනයේ දී වෙන්දේසිය පැවැත්වීමට පැයකට පෙර අධිකරණ රෙජිස්ට්‍රාර්වරයා වෙත හිමිකම් ඉදිරිපත් කල යුතුය.

03. අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පෙර වෙන්දේසියේ විකිණීමට සූදානම් කර ඇති භාණ්ඩයන් පරීක්ෂා කළ හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩයන් වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ බලය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගන්නා භාණ්ඩ සඳහා එම අවස්ථාවේදී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කරගත යුතුය. සියලුම ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර, චෙක්පත් හා මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිලදී ගැනීමට පැමිණෙන සෑම අයෙකුම තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යය වන අතර, මිල දී ගන්නා සියලුම භාණ්ඩ එදිනම **පස්වරු 4.00** ට පෙර අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතුය.

ඩී. එල්. ඒ. එන්. විමලරත්න,
අතිරේක දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා හා මහෙස්ත්‍රාත් අධිකරණය - පුත්තලම.

2024 අගෝස්තු මස 01 වැනි දින,
පුත්තලම දිසා හා මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| *අනු. අංකය* | *නඩු අංකය* | *PR අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|---|
| 01 | 58485 | 457/19 | SIFANG වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අත්ට්‍රැක්ටරය සහ ටේලරය |
| 02 | 04078 | 396/14 | SIFANG වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අත්ට්‍රැක්ටරය සහ ටේලරය |
| 03 | 30026 | 101/17 | UNIMO වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අත්ට්‍රැක්ටරය |
| 04 | 37399 | 600/17 | CENFIN වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි අත්ට්‍රැක්ටරය සහ ටේලරය |
| 05 | AR 1231/20 | 3466/18 | MB-0609 ලියාපදිංචි කළ නොහැකි YAMAHA වර්ගයේ LIBERO යතුරු පැදිය |
| 06 | 42542 | 703/18 | BAG - 8060 ලියාපදිංචි කළ නොහැකි Pulsar 150 වර්ගයේ යතුරු පැදිය |
| 07 | 49381 | | XD - 3135 දරන ලියාපදිංචි කළ නොහැකි XL - Degree වර්ගයේ යතුරු පැදිය |

| අනු. අංකය | නඩු අංකය | PR අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|---|
| 08 | AR 93/21 | 156/19 | NU - 5744 දරන ලියාපදිංචි කළ නොහැකි LX 110 වර්ගයේ යතුරු පැදිය |
| 09 | AR 90/21 | 775/18 | XD - 2741 දරන DIDO වර්ගයේ CF 48 දරන ලියාපදිංචි කළ නොහැකි යතුරු පැදිය |
| 10 | AR 89/21 | 492/17 | HW - 5155 දරන TVS Victor වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි යතුරු පැදිය |
| 11 | AR 91/21 | 864/18 | TI - 9180 දරන YAMATO Z 100 වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි යතුරු පැදිය |
| 12 | AR 2221/22 | 433/21 | NW UM - 0065 LONCIN වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි යතුරු පැදිය |
| 13 | AR 4296/23 | 3214/23 | හොන්ඩා ඩිනර් වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි යතුරු පැදිය |
| 14 | AR 4150/23 | 1063/23 | YAMAHA TD 125 ට්‍රේල් වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි යතුරු පැදිය |
| 15 | AR 4526/23 | 370/23 | HS - 6109 TVS Victer වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි යතුරු පැදිය |
| 16 | AR 4294/23 | 2151/23 | HONDA XL 250 වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි යතුරු පැදිය |
| 17 | AR 407/21 | | NWUF - 1763 දරන BAJAJ CT 100 වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි යතුරු පැදිය |
| 18 | AR 407/21 | | ML - 0665 දරන BAJAJ CT 100 වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි යතුරු පැදිය |
| 19 | AR 1428/22 | 423/21 | MK - 2132 දරන BAJAJ CT 100 වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි යතුරු පැදිය |
| 20 | AR 2218/22 | 814/21 | WFME - 9676 දරන BAJAJ CT 100 වර්ගයේ ලියාපදිංචි කළ නොහැකි යතුරු පැදිය |
| 21 | AR 2220/22 | 321/21 | නිල් පැහැති පා පැදිය |
| 22 | 64238 | | වතුර මෝටරය සහ අඩි 125 ක් දිග වයර් 01 |
| 23 | 67381 | 629/20 | ගෑස් ලිප් 01 |
| 24 | 67583 | 691/20 | ගෑස් ලිප් 01 |
| 25 | 68174 | 1607/20 | ගෑස් ලිප් 01 |
| 26 | 68212 | 688/20 | ගෑස් ලිප් 01 |
| 27 | 69103 | 478/20 | ගෑස් ලිප් 01 |
| 28 | 72331 | 1195/20 | ගෑස් ලිප් 01 |
| 29 | 09355 | 770/23 | උල් කටු 03 හා කම්බි 02 |

| *අනු. අංකය* | *නඩු අංකය* | *PR අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|---|
| 30 | 09355 | 770/23 | මිටි 02 |
| 31 | 93935 | 445/22 | හිල්ටි කටුව සහිත DONGCHEN වර්ගයේ හිල්ටි 01 |
| 32 | අංක රහිත | | සවල් 05 |
| 33 | අංක රහිත | | බැරල් 30 |
| 34 | අංක රහිත | | ලොකු බූලි තොගයක් |
| 35 | අංක රහිත | | පොඩි කෑන් තොගයක් |
| 36 | අංක රහිත | | වීදුරු බෝතල් තොගයක් |

08 - 119

---

**මහෙස්ත්‍රාත් අධිකරණය - කැකිරාව**

අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. කැකිරාව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළ රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් කිසිවෙකු හිමිකම් නොකියන ලද පහත සඳහන් ද්‍රව්‍ය **2024.09.07** වැනි දින **පෙ.ව. 09.00** ට මෙම අධිකරණ භූමියේ දී විකුණනු ලැබේ.

02. මෙහි සඳහන්වන කිසියම් භාණ්ඩයක් පිළිබඳ කිසිවෙකු අයිතිවාසිකම් දක්වන්නේ නම්, වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂාකර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හිදී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත්කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩයන් එවලේම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත්කර ගත යුතුය. සියලු ගෙවීම් මුදලින් කළ යුතු වන අතර, චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිල දී ගැනීමට පැමිණෙන ගැනුම්කරුවන් තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

ඒ. ඩබ්ලිව්. යූ. ඒ. ගුණසේකර,
අතිරේක දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - කැකිරාව.

2024 අගෝස්තු මස 05 වන දින,
කැකිරාව දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේදී ය.

**උපලේඛනය**

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | 48501 | NC LE 1548 ලොරි රථය | 01 |
| 02 | 23463/21929 | RC 8731 ලොකු ට්‍රැක්ටර් රථය | 01 |
| 03 | 48624 | NW UK 4952 යතුරු පැදිය | 01 |
| 04 | 67180 | WP BFT 9502 යතුරු පැදිය | 01 |
| 05 | 47878 | NC XR 8832 යතුරු පැදිය | 01 |
| 06 | 77160 | WP TY 3526 යතුරු පැදිය | 01 |
| 07 | 72492 | WP BCI 8231 යතුරු පැදිය | 01 |
| 08 | 13988 | NW BBD 3652 යතුරු පැදිය | 01 |
| 09 | 66017 | WP TC 9710 යතුරු පැදිය | 01 |
| 10 | 4476 | NC JN 2534 යතුරු පැදිය | 01 |
| 11 | 50267 | CP MH 6056 යතුරු පැදිය | 01 |
| 12 | 85292 | I. පොරව<br>II. කැති | 01<br>01 |
| 13 | 78569 | කැති | 01 |
| 14 | 69694 | කැති | 01 |
| 15 | 56379 | කැති | 01 |
| 16 | 85546 | 12.5 kg ප්‍රමාණයේ ගෑස් සිලින්ඩර් | 01 |
| 17 | 81642 | I. තරාදි<br>II. 1 kg පඩි | 01<br>01 |
| 18 | 77431 | I. විදුලි පන්දම්<br>II. භාජන<br>III. ප්ලාස්ටික් කෑන් | 04<br>02<br>01 |
| 19 | 82935 | 40 kg ඉලෙක්ට්‍රොනික් තරාදිය | 01 |
| 20 | 83887 | උදලු | 01 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩය | ප්‍රමාණය |
|---|---|---|---|
| 21 | 76418 | ආරක්ෂිත හිස්වැසුම් | 02 |
| 22 | 70619 | I. ජංගම දුරකථන<br>II. ආරක්ෂක හිස්වැසුම් | 01<br>02 |
| 23 | අංක රහිත | වීදුරු බෝතල්/ප්ලාස්ටික් බෝතල් | තොගයක් |
| 24 | අංක රහිත | බූලි (ලොකු/කුඩා) | තොගයක් |
| 25 | අංක රහිත | බැරල් (ලොකු/පොඩි) | 80 |

08 - 129

---

## මහෙස්ත්‍රාත් අධිකරණය - නාඋල

### රාජසන්තක කරනු ලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. නාඋල මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරනු ලැබූ භාණ්ඩ **2024.09.08** වැනි දින **පෙ.ව. 9.30** ට එම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

02. පහත උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම්පාන්නෙකු වේ නම්, වෙන්දේසිය පවත්වන දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳ සලකා බැලීම සඳහා අදාළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය එක හමාරකට පෙර වෙන්දේසියට නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ දී, අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර දැමීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ භාර ගැනීමේ දී හා මුදල් ගෙවීමේ දී තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර මිල දී ගැනීමට පැමිණෙන සෑම අයෙකුට ම ජාතික හැඳුනුම්පත තිබීම අනිවාර්යය වේ.

06. භාණ්ඩ මිල දී ගැනීම මුදලින් කළ යුතු අතර මිල දී ගන්නා ලද භාණ්ඩ වෙන්දේසිය පවත්වන දිනයේ දී **ප.ව. 4.00** ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

එන්. ටී. බී. ඉලංගරත්න,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය - නාඋල.

2024 අගෝස්තු මස 07 වැනි දින,
නාඋල මහෙස්ත්‍රාත් අධිකරණයේ දීය.

**වෙන්දේසි භාණ්ඩ ලැයිස්තුව**

| අනු අංකය | නඩු අංකය | *B* අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|---|
| 01 | 33131 | - | ජංගම දුරකථන 02 යි |
| 02 | 24598 | B 185/2017 | කැඩී ගිය ජංගම දුරකථන 02 යි |
| 03 | 28636 | B 285/2018 | ජංගම දුරකථන |
| 04 | - | B 131/2010 | ඉමී අංක : 356281/01/043925/1 දරන NOKIA වර්ගයේ ජංගම දුරකථනය |
| 05 | - | B 648/2009 | ALFATEL වර්ගයේ ජංගම දුරකථනය |
| 06 | - | B 394/2015 | CCIT වර්ගයේ ඉමී අංක : 868746011157970 දරන ජංගම දුරකථනය |
| 07 | 13491 | B 564/2008 | SONY ERICSON වර්ගයේ 35970701-498652-2 දරන ජංගම දුරකථනය |
| 08 | 3537 | B 114/2012 | FORME වර්ගයේ ඉමී අංක : 359709043983082 දරන ජංගම දුරකථනය - (ඉමී අංක : 356231/04/897109/8 දරන ජංගම දුරකථනය) |
| 09 | 788 | PR 146/2011 | NOKIA වර්ගයේ ඉමී අංක : 355037091595838 දරන ජංගම දුරකථනය |
| 10 | - | B 81/2010 | ALFATEL වර්ගයේ ජංගම දුරකථනය |
| 11 | 9977 | - | FORME වර්ගයේ ඉමී අංක : 357119050841060 දරන ජංගම දුරකථනය |
| 12 | අංක රහිත | | RAENO වර්ගයේ ඉමී අංක : 860787020901519 දරන ජංගම දුරකථනය |
| 13 | අංක රහිත | | FORME වර්ගයේ කැඩී ගිය ජංගම දුරකථනය |
| 14 | අංක රහිත | | වයර් තොගයක් |
| 15 | අංක රහිත | | සවල් 03 ක් |
| 16 | අංක රහිත | | PLASTIC කුඩ (කුඩා) |
| 17 | 47653 | | PLASTIC කුඩ (කුඩා) |
| 18 | අංක රහිත | | කුඩා ප්‍රමාණයේ වැලි හලන සල්ලඩ 05 ක් |

| *අනු අංකය* | *නඩු අංකය* | *B අංකය* | *භාණ්ඩ විස්තරය* |
|---|---|---|---|
| 19 | අංක රහිත | | උදලු 03 ක් |
| 20 | අංක රහිත | | PLASTIC බකට් 02 යි |
| 21 | අංක රහිත | | ගල් විදින කටු 07 යි |
| 22 | අංක රහිත | | කුඩා යකඩ ඉනි 01 යි |
| 23 | අංක රහිත | | බෝතල් තොගයක් |
| 24 | අංක රහිත | | බූලි තොගයක් |
| 25 | අංක රහිත | | රේඩියෝ 02 යි (පැරණි අබලන්) |
| 26 | අංක රහිත | | හිල් විදින ලද PLASTIC බාල්දි 03 යි |
| 27 | B 125/20 | | අත් ට්‍රැක්ටරයක් |

08 - 131

---

**සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය - ලග්ගල**

අධිකරණය මගින් රාජසන්තක කරනු ලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. ලග්ගල සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරනු ලැබූ භාණ්ඩ **2024.09.07 වැනි දින පෙ.ව. 9.30** ට එම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

02. පහත උපලේඛනයේ සඳහන් කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම්පාන්නෙකු වේ නම්, වෙන්දේසිය පවත්වන දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳ සලකා බැලීම සඳහා අදාළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරගනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය එක හමාරකට පෙර වෙන්දේසියට නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවේ දී, අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩ භාර ගැනීමේ දී හා මුදල් ගෙවීමේ දී තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර මිල දී ගැනීමට පැමිණෙන සෑම අයෙකුට ම ජාතික හැඳුනුම්පත තිබීම අනිවාර්යය වේ.

06. භාණ්ඩ මිලදී ගැනීම මුදලින් කළ යුතු අතර මිලදී ගන්නා ලද භාණ්ඩ වෙන්දේසිය පවත්වන දිනයේ දී ප.ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

එන්. ටී. බී. ඉලංගරත්න,
මහෙස්ත්‍රාත්,
මහෙස්ත්‍රාත් අධිකරණය - නාඋල.

2024 අගෝස්තු මස 07 වැනි දින,
නාඋල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**උපලේඛනය**

| අනු අංකය | නඩු අංකය | B අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|---|
| 01 | 36142 | B 366/20 | ජංගම දුරකථන 02 යි |
| 02 | 8709 | B 231/2012 | ජංගම දුරකථන 01 යි |
| 03 | 15418 | - | ජංගම දුරකථන 01 යි |
| 04 | 33408 | - | ජංගම දුරකථන 01 යි |
| 05 | 45559 | B 599/2021 | ජංගම දුරකථන 01 යි |
| 06 | අංක රහිත | B 110/2012 | Greentel වර්ගයේ ඉමී අංක : 359407040011376 දරන ජංගම දුරකථනය |
| 07 | අංක රහිත | B 560/2013 | HX MOBILE වර්ගයේ ඉමී අංකː 357479049641900 දරන ජංගම දුරකථනය |
| 08 | අංක රහිත | - | SAMSUNG වර්ගයේ ඉමී අංක : 357276/04/264467/9 දරන ජංගම දුරකථනය 01 යි |
| 09 | අංක රහිත | B 1056/2009 | 358448020004224 ඉමී අංක දරන ජංගම දුරකථන 01 යි |
| 10 | අංක රහිත | B 109/2014 | වර්ගය සහ ඉමී අංකය අපැහැදිලි ජංගම දුරකථන 01 යි |
| 11 | අංක රහිත | B 426/2014 | ඉමී අංක : 357055/05/910247/8 දරන ජංගම දුරකථන 01 යි |
| 12 | 13947 | PR 183/2015 | ජංගම දුරකථන 01 යි |
| 13 | අංක රහිත | B 14/2013 | ජංගම දුරකථන 01 යි |

| අනු අංකය | නඩු අංකය | B අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|---|
| 14 | අංක රහිත | B 284/2012 | පිටුපස කවරය නොමැති ජංගම දුරකථන 01 යි |
| 15 | 22303 | PR 193/2009 | ජංගම දුරකථන 01 යි |
| 16 | අංක රහිත | - | SWITCH වර්ගයේ ඉමී අංක : 351530110084754 දරන ජංගම දුරකථන 01යි |
| 17 | අංක රහිත | B 49/2008 | ජංගම දුරකථන 01 යි |
| 18 | 25715 | PR 899/2017 | ජංගම දුරකථන 01 යි |
| 19 | අංක රහිත | - | ජංගම දුරකථන 01 යි |
| 20 | 31223 | - | මුට්ටි 01 යි |
| 21 | 48707 | - | මුට්ටි 01 යි |
| 22 | 46326 | - | මුට්ටි 01 යි |
| 23 | අංක රහිත | - | මුට්ටි 02 යි |
| 24 | අංක රහිත | - | කුඩා මුට්ටි 02 යි |
| 25 | අංක රහිත | - | උදළු 07 යි |
| 26 | අංක රහිත | - | සවල් 04 යි |
| 27 | අංක රහිත | - | යකඩ බාල්දි තොගයක් |
| 28 | අංක රහිත | - | බූලි තොගයක් |
| 29 | අංක රහිත | - | බෝතල් තොගයක් |
| 30 | අංක රහිත | - | කළ තොගයක් |
| 31 | 30745 | B 129/2019 | අත් ට්‍රැක්ටරයක් |

# තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## ජා ඇල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය

2025 ජනවාරි මස 01 වැනි දින සිට 2025 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාලය සඳහා
රා තැබෑරුම් රේන්ද විකිණීම

**2025 ජනවාරි මස 01 වැනි දින සිට 2025 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා** කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ වී ඇති රා රේන්ද විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකටම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත්ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති ටෙන්ඩර් තැන්පත් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මිල ප්‍රමාණයෙන් යටත් පිරිසෙයින් 15% කට ලබාගත් වටිනාකම් සහතිකයක් ද ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි "අංක.................... දරන............................ රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත උපලේඛනයෙහි සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කොට **2024.09.27 වැනි දින පෙ.ව. 10.30** ට පෙර ජා ඇල ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. *නැතහොත්* එම වේලාවට පෙර ජා ඇල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

05. **2024.09.27 වැනි දින පෙ.ව. 10.30** ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ සියලුම ටෙන්ඩර්කරුවන් ජා ඇල ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම **2024.10.25 දින පෙ.ව. 10.30** ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර ජා ඇල ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි ය.

දුරකථන අංකය : 011- 2236428.

පී. ඒ. ඒ. එස්. වීරසේකර,
ප්‍රාදේශීය ලේකම්,
ජා ඇල.

2024 අගෝස්තු මස 01 වැනි දින,
මගේ අංකය : ජා/1/7/02/06.
ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය,
ජා-ඇල.

**උපලේඛනය**

| *අනු අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *ටෙන්ඩර් භාරගන්නා අන්තිම දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල (රුපියල්)* |
|---|---|---|---|---|
| 01 | ජා ඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | කඳාන | 2024.09.27 පෙ.ව. 10.30 | 1,500.00 |
| 02 | | වැලිගම්පිටිය | | 1,500.00 |
| 03 | | කණුවන | | 4,000.00 |
| 04 | | මඩමවත්ත ඒකල | | 5,000.00 |
| 05 | | දඬුගම | | 1,000.00 |

## මඩකලපුව දිස්ත්‍රික්කය

## කෝරළේපත්තු උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වාහරේ රා තැබෑරුම් රේන්ද විකිණීම

2024 ජූලි මස 01 දින සිට 2025 ජුනි මස 30 වැනි දින දක්වා

අංක 207 දරන 1982.08.20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පළකරන ලද 1982 වර්ෂයේ රා තැබෑරුම් රේන්ද විකිණීමේ විධිවිධානයේ මඩකලපුව දිස්ත්‍රික්කයේ කෝරළේපත්තුව උතුර, වාහරේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වාහරේ රා තැබෑරුම් සඳහා **2024 ජූලි මස 01 දින සිට 2025 ජුනි මස 30 දින දක්වා** රා විකිණීමේ පෞද්ගලික අයිතියට ටෙන්ඩර් ඉල්ලුම්පත් පහත සඳහන් දින හා වේලාව දක්වා කෝරළේපත්තුව උතුර, වාහරේ ප්‍රාදේශීය ලේකම් විසින් එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී භාරගනු ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ ටෙන්ඩර්කරුවන් කෝරළේපත්තුව උතුර, වාහරේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණිය යුතු ය.

01. ටෙන්ඩර් ඉල්ලුම්පත්‍රය වෙනුවෙන් රු. 1,500 ක මුදලක් කෝරළේපත්තුව උතුර, වාහරේ ප්‍රාදේශීය ලේකම් නමින් එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ගෙවා ලබා ගන්නා ලද රිසිට්පත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඉල්ලුම්පත ලබා ගත හැකි ය. ටෙන්ඩර්පත් සමග රිසිට්පත අමුණා තිබිය යුතුයි. ටෙන්ඩර්පත් නිකුත් කරනු ලබන්නේ **2024.08.16 දින සිට 2024.08.20 වැනි දින පෙ. ව. 11.00 දක්වා වේ.**

02. ඒ ඒ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන වටිනාකම් සහතික ටෙන්ඩර්කරුවන් බදු පත්‍රයේ සඳහන් කරනු ලබන මුදලින් 15%කට නොඅඩු නොවිය යුතු ය. මෙම වටිනාකම් සහතිකය ටෙන්ඩර් පත්‍රය සමග ඇමිණිය යුතු ය.

03. ටෙන්ඩර්පත් වැරදි ලෙස පුරවා තිබේනම් එය ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් නොකර ටෙන්ඩර්පත්‍ර සඳහා ගෙවන ලද මුදල නැවත ලබා ගැනීමට අවශ්‍ය නම් ඔබගේ ඉල්ලීම ටෙන්ඩර්පත්‍ර ඉදිරිපත් කරන ලද දින සිට සති දෙක ඇතුළත ඔබ විසින් ලබාගත් ටෙන්ඩර්පත සම්පූර්ණ නොකර මුදල් ගෙවූ රිසිට්පත් සමග නැවත ඉදිරිපත් කරන්නේ නම් එම ඉල්ලීම සලකා බලනු ලැබේ.

05. දැනට තිබෙන තැබෑරුම් ඉඩම් ඉදිරි කාලයටත් ලබා ගැනීමට හැකිදැයි සහතික විය නොහැක.

06. ලියාපදිංචි කරන ලද පොල් සහ තල් සංගම් මෙම රේන්ද විකිණීමේ දී සහභාගිවන්නේ නම් සංගමය පිහිටා තිබෙන ප්‍රදේශයට අදාළ රා තැබෑරුමට පමණක් ඉල්ලුම්පත් ඉදිරිපත් කළ හැකි ය. ඒ සමග සංගමය දැනට ක්‍රියාත්මක වන බවටත් සංගමය විසින් රා තැබෑරුම් බදු ගෙන පවත්වා ගෙන යාමට හැකියාව තිබීම සම්බන්ධව මඩකලපුව දිස්ත්‍රික් සමුපකාර සහකාර කොමසාරිස් විසින් සහතික කරන ලද ලිපිය ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ටෙන්ඩර්පත් නිකුත් කරනු ලැබේ. (මුදල් අමාත්‍යාංශයේ අංක 01/2012 දරන හා 2012.01.05 වැනි දිනැති චක්‍රලේඛනයට අනුව)

07. අනිකුත් තොරතුරු කෝරළේපත්තුව උතුර, වාහරේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකි ය.

| *තැබෑරුම් පිහිටුවිය යුතු ස්ථානය* | *තැබෑරුමේ අංකය* | *ඉල්ලුම්පත් භාර ගන්නා අවසන්* | |
|---|---|---|---|
| | | දිනය | වේලාව |
| පාල්චේනයි ග්‍රාම නිලධාරී වසම | TT No. 05 | 2024.08.21 | පෙ.ව. 10.30 |

**සටහන .-** 1. ටෙන්ඩර් කමිටුව 2024.08.21 දින පෙ. ව. 10.30 ට රැස්වේ.

2. විකිණීමේ දිනයේ සුදුසු බදුකරු තෝරා නොගත්තොත් නැවත විකිණීමේ ටෙන්ඩර් කමිටුව **2024.08.28 වැනි දින පෙ.ව. 10.30**ට රැස්වේ.

අමලිනි. කේ,
ප්‍රාදේශීය ලේකම්,
කෝරළේපත්තුව උතුර, වාහරේ.

2024 අගෝස්තු මස 07 වැනි දින.

08 - 137

## වලපනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

## 2025 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දිනැති අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළකර ඇති 1983 වර්ෂයට සහ ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු රා තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී බලපවත්නා සෑම සුරාබදු කොන්දේසියකටමත් යටත් ව **2025** වර්ෂය තුළ දී පහත දැක්වෙන උපලේඛනයන් හි දැක්වෙන රා තැබෑරුම්වල සිල්ලරට රා විකිණීමේ තනි අයිතිය මිල දී ගැනීම සඳහා වලපනේ ප්‍රාදේශීය ලේකම් විසින් **2024.09.04** වැනි දින **පෙ. ව. 10.30** දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. (*අ*) සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමයක් විය යුතු ය.

(*ආ*) ඇප මුදල් වශයෙන් දිවයිනේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට පහත උපලේඛනයෙහි දැක්වෙන ආකාරයට ටෙන්ඩර් මුදල් තැන්පත් කර ලබාගන්නා නිල කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතු ය.

(*ඇ*) ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගන්නා ලද වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම පිළිබඳ යථෝක්ත රා තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර්කරුවන් වෙත නිවේදනය කෙරේ.

(*ඈ*) ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැලකිළිමත් විය යුතු ය :

(a) ටෙන්ඩර් පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. එසේ කිරීමේ දී එහි සඳහන් කරන ගණන් ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය,

(b) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන්වලට අමතරව ජාතික හැඳුනුම්පත් අංකය ද යෙදිය යුතු ය,

(c) සෑම වෙනස් කිරීමක්/කපා හැරීමක් ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන හා දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය,

(d) සෑම ටෙන්ඩර්කරුවෙක් ම ටෙන්ඩර් පෝරම සමග තමන්ගේ සහතික කරන ලද ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.

මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබාගන්නා ලද නිල කුවිතාන්සිය සහ වත්කම් පිළිබඳ සහතිකයක් සමග ලියුම් කවරයක බහා මුද්‍රා තබා කවරයේ වම් පස ඉහළ කෙළවරේ නියමිත තැබෑරුම් අංකය සහ නම සඳහන් කර, වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාරගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතු ය. ටෙන්ඩර්පත් තැපෑලෙන් එවන්නේ නම් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර, වලපනේ ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වලපනේ, නිල්දණ්ඩාහින්න යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත සඳහන් උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාරගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතු ය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ගැණුම්කරු ලෙස ප්‍රකාශයට පත්කළ වහාම එදින පස්වරු 2.00ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන් වලපනේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි වාරික තුනකට නොඅඩු මුදලක් ඇප තැන්පත් වශයෙන් වලපනේ ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතුය. එම මුදල මා නමින් නිල්දණ්ඩාහින්න මහජන බැංකුවේ වර්ෂයක ස්ථාවර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතුය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුවක් විසින් ගෙවීම සඳහා ද යන්න සඳහන් කරන ලද චෙක්පතකින් හෝ ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතුය.

07. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතුය.

08. පොරොන්දුවන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

09. කිසියම් ටෙන්ඩරයක් කිහිපදෙනෙකු විසින් හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම්, ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතුය.

10. යම් රා තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත් 2024.10.02 දින පෙ.ව. 10.30 ට මෙම ස්ථානයේ දී ම විකුණනු ලැබේ.

11. මෙම ටෙන්ඩරය විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

12. රේන්ද විකිණීම හා අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා ලබාගත හැකිය.

උපලේඛනය

| *අංකය හා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටි ස්ථානය* | *ටෙන්ඩර් භාරගන්නා අවසන් වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශත* |
|---|---|---|---|
| අංක 05<br>පදියපැලැල්ල | පදියපැලැල්ල ග්‍රාම නිලධාරී වසම | 2024.09.04<br>පෙ.ව. 10.30 | 5,000 |

දුරකථන අංක : 052 2278000/052 2278157

එස්. එම්. සී. සමරකෝන්,
ප්‍රාදේශීය ලේකම්,
වලපනේ.

2024 අගෝස්තු මස 01 වැනි දින,
වලපනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 135

---

# රජයේ නොවන දැන්වීම්

## ඊසි ඩිස්ට්‍රිබියුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ ලියාපදිංචි අංකය PV 7277

**2007 අංක 7 දරන සමාගම් පනතේ 346 (1) වගන්තිය යටතේ ඈවරකරුගේ පත්වීමේ දැන්වීම**

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | ඊසි ඩිස්ට්‍රිබියුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය | : | අංක 17, සමගි මාවත, බොරුපන පාර, රත්මලාන. |
| උසාවිය | : | බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය - කොළඹ (සිවිල්) |
| නඩු අංකය | : | 73/2021/CO |
| ඈවරකරුගේ නම | : | ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ් |
| ලිපිනය | : | ඈවරකරු,<br>ඩිලොයිට් ඇසෝසියේට්ස් බාරේ (පෙර SJMS ඇසෝසියේට්ස්),<br>අංක 11, කාසල් පටුමග,<br>කොළඹ 04. |
| පත්වීමේ දිනය | : | 2021 දෙසැම්බර් 13 |

08 - 97/1

## ඊසි ඩිස්ට්‍රිබියුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ ලියාපදිංචි අංකය PV 7277

**2007 අංක 7 දරන සමාගම් පනතේ XIII කොටස යටතේ පරිවෘත කිරීමේ නියෝගය**

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | ඊසි ඩිස්ට්‍රිබියුෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය | : | අංක 17, සමගි මාවත, බොරුපන පාර, රත්මලාන. |
| උසාවිය | : | බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය - කොළඹ (සිවිල්) |
| නඩු අංකය | : | 73/2021/CO |
| නියෝගය දුන් දිනය | : | 2021 දෙසැම්බර් 13 |
| පෙත්සම ඉදිරිපත් කළ දිනය | : | 2021 සැප්තැම්බර් 16 |
| ඇවරකරුගේ නම | : | ජෙරාඩ් ජීවානන්තන් ඩේවිඩ් |
| ලිපිනය | : | ඇවරකරු,<br>ඩිලොයිට් ඇසෝසියේට්ස් බාරේ (පෙර SJMS ඇසෝසියේට්ස්),<br>අංක 11, කාසල් පටුමග,<br>කොළඹ 04. |

08 - 97/2

---

## සූරි ට්‍රේඩින් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ ලියාපදිංචි අංකය PV 4288

**සමාගම විසුරුවා හැරීමේ සහ ඇවරකරු නිදහස් කිරීමේ දැන්වීම**

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | සූරි ට්‍රේඩින් කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය | : | අංක 06, බංගලාවත්ත පාර, මාබෝල, වත්තල. |
| උසාවිය | : | බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය - කොළඹ (සිවිල්) |
| නඩු අංකය | : | HC/(CIVIL) 02/2013/CO |
| ඇවරකරුගේ නම | : | ජී. ජේ. ඩේවිඩ් |
| ලිපිනය | : | SJMS ඇසෝසියේට්ස් බාරේ (දැනට ඩිලොයිට් ඇසෝසියේට්ස්),<br>4 වන මහළ, අංක 02 (දැනට 3 වන මහළ, අංක 11),<br>කාසල් පටුමග, කොළඹ 04. |
| සමාගම විසුරුවා හැරීමේ සහ ඇවරකරු නිදහස් කිරීමේ දිනය | : | 2024 ජූලි මස 19. |

08 - 98

## රෙසල් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 59(2) වගන්තිය යටතේ ප්‍රසිද්ධ දැන්වීමයි.

කොළඹ 04, ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් මාවතේ (පෙර ඩික්මන්ස් පාර ලෙස හැඳින්වූ), අංක 28, හි ස්වකීය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන රෙසල් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ් (සමාගම් අංක PV 112653) විසින් ශ්‍රී ලංකා මුදලින් රුපියල් තුන්සිය දහඅට මිලියන තුන්සිය තිස් හය දහස් හාරසිය පනස් හයක මුදලකින් (LKR 318,336,456.00) ප්‍රකාශ කළ ප්‍රාග්ධනයේ ප්‍රාග්ධන අවකරණයක් සිදුකිරීමේ යෝජනාව 2007 අංක 7 දරන සමාගම් පනතේ 59(2) වගන්තිය යටතේ මෙයින් ප්‍රසිද්ධ දැන්වීම් කරනු ලබන වගයි.

සමාගම් අධ්‍යක්ෂවරු,

රෙසල් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමටඩ්.

08 - 106

---

## පොදු සමාගමකට පරිවර්තනය කිරීමේදී නම වෙනස් කිරීම

2007 අංක 07 සමාගම් පනතේ 11(5) වගන්තිය අනුව දැනුම්දීම මෙයින් ලබා දී ඇත, මහාරාජා ෆුඩ්ස් ලිමිටඩ් (සමාගම් අංකය (PB 00296080) 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති සමාගම එහි ලියාපදිංචි කාර්යාල අංක 18/3, Dr. E. A. කුරේ මාවත, කොළඹ - 06 යන ස්ථානයේ පොදු සමාගමක් (පීඑල්සී) බවට පරිවර්තනය කරනු ඇත. 2024 ජූලි මස 26 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි පනතේ 28 වැනි වගන්තියට අනුව මහාරාජා ෆුඩ්ස් පීඑල්සී සමාගමක් වන අතර පනතේ 11(1) වගන්තියට අනුව සමාගම එහි නම වෙනස් කර ඇති බව සලකනු ලැබේ.

මණ්ඩලයේ නියෝගයෙන්,

සමාගම් ලේකම්වරු,

චාර්ට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමටඩ්,
අංක 09, 03 වන මහළ,
පාසල් පටුමග, කොළඹ 03.

08 - 107

---

## මග නැගුම රෝඩ් කන්ස්ට්‍රක්ෂන් ඉක්විප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගමේ ලියාපදිංචි අංකය PV 16847

තාවකාලික ඇවරකරු නිදහස් කිරීමේ දැන්වීම

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | මග නැගුම රෝඩ් කන්ස්ට්‍රක්ෂන් ඉක්විප්මන්ට් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය | : | අංක 81/4, නව නුගේ පාර, පැලියගොඩ. |
| උසාවිය | : | බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය (කොළඹ සිවිල්) |
| නඩු අංකය | : | HC/(Civil) 32/2023/CO |
| තාවකාලික ඇවරකරුගේ නම | : | ජී. ජේ. ඩේවිඩ් |
| ලිපිනය | : | තාවකාලික ඇවරකරු,<br>ඩිලොයිට් ඇසෝසියේට්ස් බාරේ,<br>03 වන මහළ, අංක 11,<br>කාසල් පටුමග, කොළඹ 04. |
| තාවකාලික ඇවරකරු නිදහස් කිරීමේ දිනය | : | 2024 ජූලි මස 26. |

08 - 120

**ක්‍රොප්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

සමාගමේ ලියාපදිංචි අංකය PV 111855

2007 අංක 7 දරන සමාගම් පනතේ 346 (1) වගන්තිය යටතේ ඈවරකරුගේ පත්වීමේ දැන්වීම.

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | ක්‍රොප්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය | : | අංක 199, කිව් පාර, කොළඹ 02. |
| උසාවිය | : | බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය - කොළඹ (සිවිල්) |
| නඩු අංකය | : | HC/Civil / 16/2024/CO |
| ඈවරකරුගේ නම | : | ජී. ජේ. ඩේවිඩ් |
| ලිපිනය | : | ඈවරකරු,<br>ඩිලොයිට් ඇසෝසියේට්ස් බාරේ,<br>අංක 11,<br>කාසල් පටුමග, කොළඹ 04. |
| පත්වීමේ දිනය | : | 2024 ජූලි මස 12. |

08 - 121/1

---

**ක්‍රොප්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්**

සමාගමේ ලියාපදිංචි අංකය PV 111855

2007 අංක 7 දරන සමාගම් පනතේ XII කොටස යටතේ පරිවෘත කිරීමේ නියෝගය

| | | |
|---|---|---|
| සමාගමේ නම | : | ක්‍රොප්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් |
| ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය | : | අංක 199, කිව් පාර, කොළඹ 02. |
| උසාවිය | : | බස්නාහිර පළාතේ වාණිජ මහාධිකරණය - කොළඹ (සිවිල්) |
| නඩු අංකය | : | HC/Civil /16/2024/CO |
| නියෝගය දුන් දිනය | : | 2024 මාර්තු 28 |
| පෙත්සම ඉදිරිපත් කළ දිනය | : | 2024 පෙබරවාරි 22 |
| ඈවරකරුගේ නම | : | ජී. ජේ. ඩේවිඩ් |
| ලිපිනය | : | ඈවරකරු,<br>ඩිලොයිට් ඇසෝසියේට්ස් බාරේ,<br>අංක 11,<br>කාසල් පටුමග, කොළඹ 04. |

08 - 121/2

---

**සන්ෂයින් හෝල්ඩිංස් පීඑල්සී සමාගම හා සන්ෂයින් පැකේජිං ලංකා ලිමිටඩ් සමාගම ඒකාබද්ධ කිරීම**

2007 අංක7 දරන සමාගම් පනතේ 242 (3) (ආ) වගන්තිය ප්‍රකාරව ඒකාබද්ධ කිරීමේ නිවේදනයයි

සන්ෂයින් හෝල්ඩිංස් පීඑල්සී සමාගම (සමාගම් අංක PQ 13) හා සන්ෂයින් පැකේජිං ලංකා ලිමිටඩ් සමාගම (සමාගම් අංක PB 165) යන සමාගම්හි අධ්‍යක්ෂ මණ්ඩල විසින් 2007අංක 07 දරන සමාගම් පනතේ 242 (1) වගන්තිය ප්‍රකාරව සන්ෂයින් හෝල්ඩිංස් පීඑල්සී සමාගම හා සන්ෂයින් පැකේජිං ලංකා ලිමිටඩ් සමාගම එක් අස්ථිත්වයක් බවට ඒකාබද්ධ කරනු ඇති බවත් මින් ඉදිරියට සන්ෂයින් හෝල්ඩිංස් පීඑල්සී සමාගම ලෙස පවත්වාගෙන යන බවටත් යෝජනා සම්මත කර ඇත.

මෙම ඒකාබද්ධ කිරීම 2024 ඔක්තෝබර් 01 දින සිට බලාත්මක වනු ඇත.

පහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල අණ පරිදි,

සන්ෂයින් හෝල්ඩිංස් පීඑල්සී
සන්ෂයින් පැකේජිං ලංකා ලිමිටඩ්.

08 - 130

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

## හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම - 2025 වර්ෂය

**2025 ජනවාරි මස 01 වැනි දින සිට 2025 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා** කාලය තුළ විදේශ මත්පැන් (ධාන්‍ය මත්පැන් ඇතුළුව) විකිණීමේ කොන්දේසි හා සෑම සුරාබදු බලපත්‍රයකට ම අදාළව එවකට පවත්නා කොන්දේසි මාලාවට යටත් ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් විදේශ මත්පැන් තැබෑරුම් සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක් ම ඕනෑම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයෙන් දක්වා ඇති ටෙන්ඩර් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මුදලෙන් යටත් පිරිසෙයින් (15%) ක වටිනාකමට ලබාගත් වත්කම් සහතිකයක් ද ඊට ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරනු ලැබූ සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනේ වම් කෙළවරෙහි "අංක.............................. දරන...................................... විදේශ මත්පැන් තැබෑරුම් සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කර **2024.09.18 වැනි දින පෙ.ව. 10.30** ට පෙර හලාවත ප්‍රාදේශීය ලේකම් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. *නැතහොත්* එම වේලාවට පෙර හලාවත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

04. 2025 වර්ෂය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළ වී ඇති අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* දැක්වෙන විදේශ මත්පැන් තැබෑරුම් කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

05. **2024.09.18 වැනි දින පෙ.ව. 10.30** ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ ටෙන්ඩර්කරුවන්ට හලාවත ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ පෙනී සිටිය හැකිය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වන විදේශ මත්පැන් තැබෑරුම් නැවත විකිණීම **2024.10.16 වැනි දින පෙ.ව. 10.30** ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට්* නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූලව විය යුතු ය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.
(දුරකථන අංක : 032- 2222138 - 2223205).

### උපලේඛනය

| *කොට්ඨාසය* | *ග්‍රාමය* | *ටෙන්ඩර් භාර ගන්නා දිනය හා වේලාව* | *ටෙන්ඩර් භාර ගන්නා දෙවන දිනය හා වේලාව* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු. ශ.* |
|---|---|---|---|---|---|
| හලාවත | අංක 07 කොටස පිටිපන වීදිය, හලාවත. | 2024.09.18 පෙ.ව. 10.30 | 2024.10.16 පෙ.ව. 10.30 | පෙ.ව. 11.00 සිට ප.ව.2.00 සහ ප. ව. 05.00 සිට ප. ව. 08.00 | 1,500.00 |
| හලාවත | අංක 06 කොටස පිටිපන වීදිය, හලාවත. | එම | එම | එම | 1,500.00 |

ඒ. එම්. සී. එම්. ප්‍රේමසූරිය,
ප්‍රාදේශීය ලේකම්.
හලාවත.

2024 අගෝස්තු මස 07 වැනි දින,
හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 117

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**කොටපොල දිසා අධිකරණයේ දී ය**

ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී, අංක 21, බ්‍රිස්ටල් වීදිය, කොළඹ 01 සහ දෙනියාය, කෙලින් වීදියේ, අංක 33/2 දරන ස්ථානයේ, "දෙනියාය ශාඛාව" යනුවෙන් සඳහන් කරනු ලබන හා හඳුන්වනු ලබන ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාර ස්ථානයක් ඇත්තේය.

*නඩු අංකය* : 12/MB
*ස්වභාවය* : උකස් බැඳුම්කරය
*මුදල්* : රු. 2,073,617.47
*කාර්ය පටිපාටිය* : සාමාන්‍ය

........................ *පැමිණිලිකරු.*

*විරුද්ධව*

1. දම්පැල්ල ගමච්චිගේ ලාල් ශාන්ත කුමාර,
2. ගනේගොඩ ගමච්චිගේ රසික ගීතාංජලී
   දෙදෙනාම "දිනිසුරු", පල්ලේගම පාර,
   දෙනියාය.

........................ *විත්තිකරුවන්.*

ඉහත සඳහන් නඩුවේ මා වෙත නිකුත් කර ඇති විකිණීමේ අධිකාරී පත්‍රය අනුව වර්ෂ 2016 ක් වූ ඔක්තෝබර් මස 13 වැනි දින මෙම නඩුවේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව පැමිණිලිකරුගේ වාසියට තීන්දු ප්‍රකාශය ඇතුළත් කර ඇත.

(අ) ඉහත නම් සඳහන් විත්තිකරු විසින් පැමිණිලිකරුට පැමිණිල්ලේ ආයාචනයේ (අ) (i) ඡෙදයේ අයැද ඇති රු. 1,223,102.13 ක් සහ රු. 525,353.76 ක් ලෙස සමස්ථය රු. 1,748,455.89 ක මුදලක් සහ එකී රු. 1,223,102.13 ක් වූ එකී මුදල මත, 2012 ජනවාරි මස 26 වැනි දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් ආගණනය කරන ලද වර්ෂයකට 14% ක අනුප්‍රමාණයක් අනුව වූ පොළියක් ද සමග අය කර ගැනීම සඳහා 1 වන හා 2 වන විත්තිකරුවන් විසින් එක්ව සහ/හෝ වෙන් වෙන්ව පැමිණිලිකාර ආයතනයට ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

ඉහත නම් සඳහන් විත්තිකරු විසින් පැමිණිලිකරුට පැමිණිල්ලේ ආයාචනයේ (අ) (ii) ඡෙදයේ අයැද ඇති රු. 301,5452.13 ක් සහ රු. 23,619.45 ක් ලෙස සමස්ථය රු. 325,161.58 ක මුදලක් සහ එකී රු. 301,542.13 ක් වූ එකී මුදල මත, 2012 ජනවාරි මස 26 වැනි දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවනු ලබන තෙක් ආගණනය කරන ලද වර්ෂයකට 14% ක අනුප්‍රමාණයක් අනුව වූ පොළියක් ද සමග අයකර ගැනීම සඳහා 1 වන හා 2 වන විත්තිකරුවන් විසින් එක්ව සහ/හෝ වෙන් වෙන්ව පැමිණිලිකාර ආයතනයට ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින්ද,

(ආ) පැමිණිල්ලේ ආයාචනයේ (ආ) ඡෙදයේ අයැද ඇති පරිදි විත්තිකරුවන් විසින් පැමිණිලිකාර ආයතනයට මෙම නඩුවේ තක්සේරු කරන ලද නඩු ගාස්තු ගෙවිය යුතු බවට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

තීන්දු ප්‍රකාශයේ සහ මෙහි වූ උපලේඛනයේ ඇති උකස් බැඳුම්කරයේ උපලේඛනයේ විස්තර කර ඇති ඉඩම හා පරිශ්‍රය ඉහත කී පැමිණිල්ලේ ආයාචනයේ (අ) සහ (ආ) අයැදීම්වල අයැද ඇති ඉහත කී මුදල් ප්‍රමාණයන් ගෙවීම සඳහා බැඳී පවතින බවට හා ක්‍රියාවේ යෙදවිය හැකි බවට නියෝග කොට තීන්දු ප්‍රකාශ කර ඇති හෙයින් ද,

වර්ෂ 2016 ක් වූ ඔක්තෝබර් මස 13 වැනි දින කොටපොල දිසා අධිකරණයේ නඩු තීන්දුව ඉටු කිරීමට විත්තිකරුවන් අපොහොසත් වී ඇති බැවින් පහත උපලේඛනයේ සඳහන් කර ඇති දේපළ එම දේපළ පිහිටි ස්ථානයේ දී,

**2024 ක් වූ සැප්තැම්බර් මස 18 වැනි දින පස්වරු 1.00 ට**

මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළය, ඇතුළත උඩුවක මතුගොඩ පිහිටා ඇත්තා වූ, ගොරකගහහේන හා ගඟුල්දොලහේන යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. යූ. අබේගුණවර්ධන විසින් සාදන ලද අංක 2643 හා 2004.09.08 වැනි දින දරන පිඹුර ප්‍රකාරව අංක 18 බිම් කැබැල්ල සහ ඒ මත පස හා වැවිලි සමඟ ද වේ. එකී අංක 18 බිම් කැබැල්ලට මායිම් උතුරින් : අංක 17, 20 (අඩි 12 ක් පළල ඇති පාර) බිම් කැබැලිවලින් ; නැගෙනහිරින් : එම ඉඩමේම අංක 14 බිම් කැබැල්ලෙන් ; දකුණින් : දෙනියාය සිට පල්ලේගම දක්වා වූ පාර ඔස්සේ වෙන් කරන ලද බිම් කොටසින් හා බස්නාහිරින් එම ඉඩමේම අංක 19 බිම් කැබැල්ලෙන් මායිම් වූ ද, ප්‍රමාණයෙන් පර්චස් තිස් පහයි දශම හයයි එකකින් (පර්. 35.61) (හෙක්ටයාර් 0.091) යුක්ත වූ බිම් කැබැල්ල වේ. මෙය කොටපොල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 88/233 හිමිකම යටතේ ලියාපදිංචි කර ඇත.

*ඉඩමට පිවිසීම :*

දෙනියාය තෙල් පිරවුම්හල ළඟින් හැරී පල්ලේගම පාරේ මීටර් 900 ක් ගියවිට පල්ලේගම පාරේ දේපළ කන්ද උඩ පිහිටා ඇත.

*ගෙවීම් ක්‍රමය:*

වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම්කරුවන් විසින් විකුණුම් මිලෙන් සියයට විසිපහක් (25%),
2. පළාත් සභා හෝ රජයේ ගාස්තු,
3. නොතාරිස් ගාස්තු, ගමන් ගාස්තු සහ විකිණීමේ කොන්දේසි සකස් කිරීමේ ගාස්තුව රු. 10,500/-,
4. සියලුම ප්‍රචාරක වියදම්,
5. වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු (සිවිල් නීති සංග්‍රහයේ 258 වගන්තිය අනුව),
6. ලිපිකරු, බෙරකරු හා සෝෂක ගාස්තුව රු. 4,500/-,
7. ගැණුම් මිලෙන් ඉතිරි සියයට හැත්තෑ පහ (75%) ක මුදල දින 30 ක් ඇතුළත දී කොටපොල දිසා අධිකරණයේ ඉහත සඳහන් නඩුවට තැන්පත් කළ යුතුය.

ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න:

සමරරත්න ඇසෝසියේට්ස්,
නීතිඥවරු සහ නොතාරිස්වරු,
අංක. 810, 2 වන මහළ,
මරදාන පාර,
කොළඹ 10.
දුරකථන : 011-2672262, 011-2762263
ෆැක්ස් : 011-2683073

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු හා උසාවි කොමසාරිස්,
වාණිජ මහාධිකරණය සහ කොළඹ
දිසා අධිකරණයේ සහ ගාල්ල දිසා අධිකරණයේ
බලයලත් වෙන්දේසිකරු රාජ්‍ය හා වාණිජ බැංකු,

අංක 7/1/10, 1 වන මහල. සුපර් මාර්කට් කම්ප්ලෙක්ස්,
බොරැල්ල, කොළඹ 08,
දුරකථන 011-2396520
ඊ මේල් : senaservice84@gmail.com

08 - 125

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.